පිළියන්දල අධ්‍යාපන කලාපය
**Piliyandala Education Zone**

7 ශ්‍රේණිය - දෙවන වාර පරීක්ෂණය 2017 ජුලි **Second Term Test 2017 - Grade 7**

සිංහල භාෂාව හා සාහිත්‍ය

කාලය පැය 2
Two Hours

* ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න.

* පහත වාක්‍යවල ඉරි ඇඳි කොටසට ගැළපෙන පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

01) ශිෂ්‍යයෝ පුස්තකාලයට පැමිණ <u>මීයට පිම්බාක්</u> මෙන් සිටියහ.
i) කෑකෝ ගසමින් ii) දැඩි නිහඬ බවකින්
iii) නො ඉවසිල්ලෙන් iv) කඩිසරව

02) මල්ලී පාසල් යාමට <u>අදිමදි කරමින්</u> හඬන්නට විය.
i) ලෝභකමින් ii) නිහඬ බවකින්
iii) නො ඉවසිල්ලෙන් iv) අකමැති බැවින්

* අංක 3-4 දක්වා ඇති පදවලින් නිවැරදි අක්ෂර වින්‍යාසය සහිත පදය තෝරන්න.

03) i) ප්‍රථිමාව ii) සාකච්චාව iii) පුස්තකාලය iv) වර්ථමානය

04) i) ලේඛම් ii) විශිෂ්ට iii) බාදාව iv) ප්‍රස්ථාර

* මුලින් දී ඇති පදයට සමාන තේරුම් දෙන පදය තෝරන්න.

05) නෙළුම - i) කුසුම ii) පද්මය iii) පුෂ්පය iv) උපුල්

06) හිරු - i) තරිඳු ii) අඹර iii) බාසුරු iv) සිසි

* මුලින් දී ඇති පදයට විරුද්ධාර්ථය දෙන පදය තෝරන්න.

07) විකසිත - i) පිපෙන ii) මුකුලිත iii) පිබිදෙන iv) සෙලවෙන

08) රෝගී - i) නිරෝගී ii) අසාධ්‍ය iii) දුබල iv) දුර්වල

* අංක 9-10 තෙක් ප්‍රශ්නවල තද කළු අකුරින් මුද්‍රිත කොටස කවර ව්‍යාකරණ වර්ගයකට අයත්දැයි තෝරන්න.

09) නැන්දා රෙදි **සෝදා** වැලේ වැනුවා ය.
i) මිශ්‍ර ක්‍රියා ii) ප්‍රයෝජ්‍ය ක්‍රියා iii) පූර්ව ක්‍රියා iv) ආශිර්වාද ක්‍රියා

10) මම පොත **කියවමින්** බසයෙන් බැස්සෙමි.
i) පූර්ව ක්‍රියා ii) විධි ක්‍රියා iii) ප්‍රයෝජ්‍ය ක්‍රියා iv) මිශ්‍ර ක්‍රියා

* අංක 11-12 තෙක් ප්‍රශ්න වල සඳහන් පදවලට සුදුසු අනුක්ත පද ලියන්න.

11) නිළියක් - ..............................................................................

12) ගොන්නු - ..............................................................................

* පහත සඳහන් වාක්‍යවල තද කළු අකුරින් මුද්‍රිත පද සඳහා සුදුසු තනි පද වරහන් තුළින් තෝරා ලියන්න.

13) **ජනයා බහුලව වාසය කරන** ප්‍රදේශවල පරිසර දූෂණය බහුලය.

i) ග්‍රාමීය ii) නාගරික iii) ගම්බද iv) ජනාකීර්ණ

14) **බොහෝ දුර දකින** නායකයෝ සමාජයට යහපතක් කරන්නෝය.

i) නිර්මාණශීලි ii) දූරදර්ශී iii) අත්තනෝමතික iv) පරාර්ථකාමී

* අංක 15-17 දක්වා වාක්‍යයන්හි කද කළු අකුරින් දක්වා ඇති පද කවර ව්‍යාකරණ වර්ගයට අයත්දැයි තෝරන්න.

15) **සුසිරිත** මිසක **දුසිරිත** කිසි තැනෙක නැතී.

i) නිපාත ii) විශේෂණ iii) උපසර්ග iv) නාමපද

16) ළමයි **සතුටින්** කෑගසති.

i) නාම විශේෂණ ii) ක්‍රියා විශේෂණ iii) උපසර්ග iv) නාමපද

17) **මල්** කුඩයක් රැගත් අක්කා නිවසට පැමිණියා ය.

i) පූර්ව ක්‍රියා ii) මිශ්‍ර ක්‍රියා iii) ක්‍රියා පද iv) නාම විශේෂණ

* නිවැරදි පිළිතුරු තෝරන්න.

18) "ළමයෙක් යන පදයේ අනුක්ත පදය වන්නේ

i) ළමයා ii) ළමයි iii) ළමයින් iv) ළමයකු

* ප්‍රශ්න අංක 19- 20 දක්වා වාක්‍යවල හිස්තැනට වඩාත් සුදුසු පදය තෝරන්න.

19) ගුරුවරු ළමයින් යහමග ....................................

i) යවයි ii) යවන්නේ ය iii) යවන්නීය iv) යවති

20) මහ සුළඟට වෘක්ෂයෝ ඇද ......................................

i) වැටෙති ii) වැටෙයි iii) වැටුණේය iv) වැටුණි

(ලකුණු 40 )

## 11 කොටස

* 1, 2 ප්‍රශ්න ඇතුළුව තවත් ප්‍රශ්න තුනක් තෝරාගෙන ප්‍රශ්න 5කට පිළිතුරු ලියන්න.

01) පන්ති කාමර ඇගයීම් ප්‍රභේදයක් ලෙස ඔබ සකස් කළ බිත්ති පුවත්පත ඇසුරින් පහත දැක්වෙන ප්‍රශ්න වලට පිළිතුරු ලියන්න.

i) ඔබ පන්තියේ සකස් කරන ලද බිත්ති පුවත්පතට යෙදූ නම කුමක්ද? (ල. 02)

ii) එම බිත්ති පුවත්පතට ඔබ ඇතුළත් කළ නිර්මාණ 2ක් ලියන්න. (ල. 02)

iii) ඔබ ඇතුළත් කළ නිර්මාණ සකස් කිරීමේදී ලැබුණු ගුරු උපදෙස් දෙකක් ලියන්න. (ල. 04)

iv) බිත්ති පුවත්පත් භාවිත කළ හැකි ආයතන 2ක් නම් කරන්න. (ල. 04)

v) බිත්ති පුවත්පත නිර්මාණය කිරීමෙන් ඔබේ ජීවිතයට ලැබුණු ප්‍රයෝජන 2ක් ලියන්න. (ල. 04)

(මුළු ලකුණු 16)

02) පහත දැක්වෙන මාතෘකා වලින් එකක් තෝරාගෙන වචන 150කට නො අඩු රචනයක් ලියන්න.

i) දහම් පාසල් අධ්‍යාපනයේ අගය

ii) දෙමවුපියන්ගේ අගය

iii) මම සිරිපා කරුණා කළෙමි.

iv) මා දුටු සීගිරිය.

v) ලොව දිනන දරුවෝ අපි වෙමු (ල. 14)

03) ග්‍රාම සංවර්ධන සමිතියේ ලේකම් ඔබ යයි සිතන්න. ප්‍රදේශය පුරා ව්‍යාප්ත වන මදුරු වසංගතය මර්දනය කිරීම සඳහා ජනතාව දැනුවත් කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කරන මෙන් ඉල්ලමින් ප්‍රදේශයේ මහජන සෞඛ්‍ය පරීක්ෂකතුමා වෙත යැවෙන ලිපියක් සකස් කරන්න.

නැතහොත්

ඔබ පාසලේ වර්ෂ අවසානයේ පැවැත්වෙන ත්‍යාග ප්‍රදානෝත්සවය සඳහා සහභාගි වන ලෙස ඉල්ලමින් ආරාධිතයන් වෙත යැවීමට සුදුසු ආරාධනා පත්‍රය සකස් කරන්න.

(ල. 10)

04) පිළිතුරු සපයන්න.

(1) ''ඉදිරියේ දී පාටව කෙරෙමි''

i) මෙසේ කීවේ කවුද?

ii) කවුරුන් සඳහාද?

iii) ඉහත ප්‍රකාශය ඇතුළත් පාඩම නම් කරන්න.

iv) එම පාඩම ඇතුළත් ජාතක කතාව අඩංගු ග්‍රන්ථය නම් කරන්න.

v) ''පාටව'' යන්නෙහි අර්ථය කුමක්ද?

(ලකුණු 2X5=10)

05) ඡේදය කියවා පිළිතුරු සපයන්න.

සන්නිවේදනය සඳහා පාරම්පරික ව භාවිතා වන්නේ හඬවල් පමණක් නොවේ. ඇසට පෙනෙන දේවලුත් ඒ සඳහා යොදා ගැනිණ. රෙදි, කොඩි ආදිය මෙන් ම 'දුම් ගොබ' ආදියත් ඒ සඳහා යොදා ගැනිණි.

පණිවිඩ යැවීම සඳහා 'දුම් ගොබ' යොදා ගැනීම රතු ඉන්දියානු ගෝත්‍රිකයන් අතර බෙහෙවින් ජනප්‍රිය සන්නිවේදන මාධ්‍යයකි. සමහර විට මේ දුම් ගොබයකින් කියවෙන පණිවිඩය එයින් මතුවන දුම් වළලු ගණන අනුව වෙනස් වන බවක් කියනු ලැබේ.

සිංහලයන් ද දුම් ගොබ මගින් පණිවිඩ යවා ඇති බව පෙනේ. රටට සතුරන් ආ අවස්ථාවල ඒ පුවත රජ වාසලට වහා ම දැනුම් දෙන ලද්දේ මේ දුම් ගොබ අහසට යැවීමෙනැයි පැරැන්නෝ කියති. මෙ සඳහා කඳු මුදුන්වල මුර පොළවල් පිහිටුවා තිබිණ.

i) මේ ඡේදයේ සඳහන් පාරම්පරික ව සන්නිවේදනය සඳහා යොදා ගත් ශ්‍රව්‍ය මාධ්‍යය කුමක්ද?

ii) ඡේදයේ සඳහන් වෙනත් පාරම්පරික සන්නිවේදන ක්‍රම 2ක් ලියන්න.

iii) සන්නිවේදනය සඳහා දුම් ගොබ යොදා ගැනීම වඩාත් ජනප්‍රිය වී ඇත්තේ කා අතරද?

iv) ඡේදයට අනුව සිංහලයන් දුම් ගොබ මඟින් පණිවිඩ යවා ඇති අවස්ථාවක් සඳහන් කරන්න.

v) දුම් ගොබයකින් කියැවෙන පණිවිඩය වෙනස් වීම කෙරෙහි බලපාන සාධකයක් ලෙස ඡේදයේ සඳහන් වන්නේ කුමක්ද?

(ලකුණු 10)

06) සුරරද සමන් සමඟින් සුරඟන එවර
පැහැනද මදාරා පරසතු මල් පතර
.................................................. ..................
.................................................. ..................

i) ඉහත කවියේ ඉතිරි පේළි දෙක සම්පූර්ණ කරන්න.
ii) එම කවියෙන් වර්ණනා කරන්නේ කුමක් පිළිබඳවද?
iii) ඉහත කවියේ අර්ථය ලියන්න.
iv) පහත දැක්වෙන පදවල අර්ථය ලියන්න.
i) නඩේගුරා - ..................................................
ii) කෝඩුකාරයා - .................................................. (ලකුණු 10)

07) සිනිඳු කොපුව ඇද හෙළා
පුවක් මලක් විහිදිලා
..................................................
..................................................

i) ඉහත කවියේ ඉතිරි පද පේළි සම්පූර්ණ කරන්න.
ii) මෙම කවිය ඇතුළත් පාඩම නම් කරන්න.
iii) එම පාඩම ඇතුළත් ග්‍රන්ථයේ කතුවරයා කවුද?
iv) එම කතුවරයා විසින් රචනා කරන ලද තවත් කාව්‍ය නිර්මාණ 2ක් ලියන්න.
v) පද්‍ය නිර්මාණයේදී ශබ්ද රසය ඇති කිරීමට යොදන යෙදුම් 2ක් ලියන්න

(ලකුණු 10)